# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,286 - 2022 ජූනි මස 24 වැනි සිකුරාදා - 2022.06.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1050 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1059 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 0 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 ජූලි මස 15 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජූලි මස 01 වැනි දින දහවල් 12 0ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

### මාර්ග නම් කිරීම සම්බන්ධව කරනු ලබන දැන්වීම

1975 අංක 04 දරන වීථි නම් කිරීම හා ස්මාරක පිහිටුවීම හා පාලනය කිරීමේ ජාතික රාජ්‍ය සභා පනත හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය ප්‍රකාරව 2020.10.02 දිනැති ලිපිය මගින් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති පහත ලේඛනයේ සඳහන් මාර්ගය සඳහා යෝජිත "පී. සී. ඉඹුලාන මාවත " නම භාවිත කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

| *අනු අංකය* | *නම් කරන ලද මාර්ගය* | *යෝජිත නාමය* |
|---|---|---|
| 01 | අඟුරුවැල්ල-වරකාපොල මාර්ගයෙන් ආරම්භ වී ඉඹුලාන-බෝපැත්ත දක්වා දිවෙන මාර්ගය | පී. සී. ඉඹුලාන මාවත |

කේ. පී. රත්නපාල පීරිස්,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
රුවන්වැල්ල.

06-315

---

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

### මාර්ග නම් කිරීම සම්බන්ධව කරනු ලබන දැන්වීම

1975 අංක 04 දරන වීථි නම් කිරීම හා ස්මාරක පිහිටුවීම හා පාලනය කිරීමේ ජාතික රාජ්‍ය සභා පනත හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය ප්‍රකාරව 2022.03.30 දිනැති ලිපිය මගින් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති පහත ලේඛනයේ සඳහන් මාර්ගය සඳහා යෝජිත "අල්හාජ් යූ. එල්. එම්. ෆාරුක් මාවත " නම භාවිත කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

| *අනු අංකය* | *නම් කරන ලද මාර්ගය* | *යෝජිත මාර්ගය* |
|---|---|---|
| 01 | කන්නන්තොට නගරයෙන් ආරම්භ වී බුලත්කොහුපිටිය මාර්ගයට සම්බන්ධ වන අතුරු මාර්ගය දක්වා දිවෙන මාර්ගය | අල්හාජ් යූ. එල්. එම්. ෆාරුක් මාවත |

කේ. පී. රත්නපාල පීරිස්,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
රුවන්වැල්ල.

06-316

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි


1989 අංක 12 දරන (ආනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(1) ආ වගන්තිය ප්‍රකාරව 2022.02.11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ ප්‍රකාශයට පත් කරන ලද පහත උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | මැටිවලහේන වත්ත මාර්ගය (උඩබද්දලව පාර) |
| ග්‍රාම නිලධාරි වසම | : | අංක 49 හෙට්ටිමුල්ල වසම |
| මාර්ගයේ දිග | : | අඩි 410 |
| මාර්ගයේ පළල | : | අඩි 10, 12 සහ 14 |

| *මාර්ගයේ දකුණු පස* | *මාර්ගයේ වම්පස* |
|---|---|
| 1. ගයාන් වනිගසේකර හිමිකම්පාන ඉඩම | 1. ඩබ්ලිව්. ඩබ්ලිව්. රුවන් කපිල චමින්ද හිමිකම්පාන ඉඩම |
| 2. එස්. එම්. දමයන්ති හිමිකම්පාන ඉඩම | 2. එම්. ආර්. අජන්තා කුමාරි බාලසූරිය හිමිකම්පාන ඉඩම |
| 3. ආර්. එම්. ඩී. පී. කේ. රණතුංග හිමිකම්පාන ඉඩම | 3. මේදා ශ්‍රීයානි සූරියප්පෙරුම හිමිකම්පාන ඉඩම |
| 4. එච්. ආර්. නවරත්න මැණිකේ හිමිකම්පාන ඉඩම | 4. එච්. ඒ. කුමාරි මදුරප්පෙරුම හිමිකම්පාන ඉඩම |
| 5. අනුරුද්ධිකා හිමිකම්පාන ඉඩම | |
| 6. ආර්. චමින්දලාල් හිමිකම්පාන ඉඩම | |
| 7. පී. ඩී. රොසන් සංජීව හිමිකම්පාන ඉඩම | |

පී. ඉන්ද්‍රානි මල්ලිකා,
ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරු,
2වන කණුව
හීයාවල
හන්දෙස්ස.




පරිමාණය 1 : 1000
සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ
පරණකූරු කෝරළයේ මාවත පත්තුවේ
ගෙවිලිපිටිය ගමෙහි පිහිටි
''මැණිවලේ ගේන දැනට වත්ත''
නමැති ඉඩම සඳහා, බලලත් මිනින්දෝරු,
ජී.ඩී.බී. ආරියරත්න මහතා විසින් සාදන ලද
අංක 2666/1 හා 2011.03.17 දින
දරණ පිඹුරේ සඳහන් කැබලි අංක 5ආ1 හි කොටසක්
පිහිටීමට ඇති ප්‍රවේශ මාර්ගය මෙහි දක්වෙන

පිඹුර

මායිම් ඉහත සඳහන් පරිදි වේ.

| කැබලි අංක | බිම් ප්‍රමාණය | | විස්තරය |
|---|---|---|---|
| | අ. රූ. ප. | හෙක්ටයාර් | |
| 1 | 0. 0. 05.4 | 0.0136 | 10' |
| 2 | 0. 0. 07.0 | 0.0177 | 12' |
| 3 | 0. 0. 01.7 | 0.0043 | 10' |
| 4 | 0. 0. 05.0 | 0.0127 | 14' |
| එකතුව ...... | 0. 0. 19.1 | 0.0483 | |

දිග : 410' - 00''
පළල : 10', 12' සහ 14'

මනින ලද දිනය : 27. 10. 2018
බෙදන ලද දිනය :

P. INDRANI MALLIKA
Registered Licence Surveyor
2nd Mile Post,
Heeyawala, Handessa
Tel No. 081 2059861
Reg. No 1990055

27. 10. 2018

සහතික පිටපතකි

කාවින්දා ගුණසේකර,
ලේකම්,
කෑගල්ල ප්‍රාදේශීය සභාව


| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | දෙවෙල්දෙනිය දික්ඇල්ල වත්ත අංක 679 මාර්ගය |
| ග්‍රාම නිලධාරි වසම | : | අංක 53 බී වල්දෙනිය වසම |
| මාර්ගයේ දිග | : | මීටර් 67.7 |
| මාර්ගයේ පළල | : | අඩි 12 |

| *මාර්ගයේ දකුණු පස* | *මාර්ගයේ වම්පස* |
|---|---|
| 1. පී. ජී. එස්. කිත්සිරි හිමිකම්පාන ලොට් අංක 02 ඉඩම | 1. පී. ජී. එස්. කිත්සිරි හිමිකම්පාන ලොට් අංක 01 ඉඩම |
| 2. එච්. ආර්. එච්. උදයංගිකා හිමිකම්පාන ලොට් අංක 05 ඉඩම | 2. ඩී. පී. එස්. පද්ම කුමාරි හිමිකම්පාන ලොට් අංක 3 ඉඩම |
| 3. ඩී. පී. එස්. රුමේෂ් කුමාර හිමිකම්පාන ලොට් අංක 06 ඉඩම | 3. අයි. එස්. ජයසිංහ හිමිකම්පාන ලොට් අංක 3 ඉඩම |
| 4. ආර්. යූ. එස්. ජයවර්ධන හිමිකම්පාන ලොට් අංක 02 ඉඩම | 4. ඩී. ආර්. බන්දුල ජයරත්න හිමිකම්පාන ලොට් අංක 1 ඉඩම |

**P.G.R.A.DINANJAYA GAMLATH**
BSc(Surveying Sciences),
Registered Government Surveyor,
Registered Licensed surveyor & Leveller
Regd.No. 20081742
No.41, Rockhill, Kegalle,
Kegalle
071-9890870, 075-9890870
e-mail-gamlathgl@gmail.com

# PLAN NO : 0117

Reference No.2020.06.KEG.0117
Field Book No.2020/03




Reference

| | |
|---|---|
| ST | Stake |
| U | Undefined |
| Road(PS) | Road(Pradeshiya Saba) |

SCALE 1:1000

PLAN

OF

An allotment of Land marked Lot 1 being resurvey of the amalgamated existing boundaries of defined Lot 8, depicted in Plan No.KGL/159, dated 25th December 2012, made by me, together with Lot 4 depicted in Plan No.2056, dated 18th January 2020, made by J.R.M.Bandara Jayakody, Lcd. Surveyor, of a land called DICKOLLAWATTA, situated at Waldeniya village within Divisional Secretariat and Pradeshiya Saba Limit of Kegalle in Mawatha Pattu of Paranakuru Korale within

KEGALLE DISTRICT

SABARAGAMUWA PROVINCE

| Lot No | Extent | | | |
|---|---|---|---|---|
| | Ha: | A: | R: | P: |
| 1 | 0.0251 | 0 | 0 | 09.91 |
| Total | 0.0251 | 0 | 0 | 09.91 |

| Section | Length(m) | Width(Ft) |
|---|---|---|
| A – B | 67.70 | 12.0 |

1. Scale applies to original only.
2. Outer boundaries surveyed as pointed out by owner of the land.

Surveyed on
Date: 26th July 2020

Use for Local Authority

සභා ලිපිගොනු
ලේකම්,
කෑගල්ල ප්‍රාදේශීය සභාව

P. G. R. A. Dinanjaya Gamlath
Registered Licensed Surveyor & Leveller
L.S.C. Regd. No. 20081742
No.41, Rockhill, Kegalle
071 - 9890870, 075 - 9890870
e-mail-gamlathgl@yahoo.com

27th July 2020

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1989 අංක 12 දරන (ආනුෂංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(1) ආ වගන්තිය ප්‍රකාරව 2022.02.03 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ ප්‍රකාශයට පත් කරන ලද පහත උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.


අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

| | | |
|---|---|---|
| පාරේ නම | : | මගුරුදෙනිය ඕවිටවත්ත පාර |
| වසම | : | 53 ඩී මාකුර |
| මාර්ගයේ දිග | : | මීටර් 100 |
| මාර්ගයේ පළල | : | අඩි 05 - අඩි 07 |

| *මාර්ගයේ දකුණු පස* | *මාර්ගයේ වම්පස* |
|---|---|
| 1. කේ. කුලතුංග හිමිකම් කියන ඉඩම | 1. ඩබ්ලිව්. ඩබ්ලිව්. සෝමරත්න හිමිකම් කියන ඉඩම |
| 2. උපාලි ප්‍රේමතිලක හිමිකම් කියන ඉඩම | 2. කේ. ඩී. ඩී. පත්මබන්දු හිමිකම් කියන ඉඩම |
| 3. කේ. ආර්. එස්. වීරසේකර හිමිකම් කියන ඉඩම | 3. ඩබ්ලිව්. ඩබ්ලිව්. එම්. ඩී. වීරසිංහ හිමිකම් කියන ඉඩම |

R.M.I.J.B.Ranatunga(M.S.I)
Registered Licensed Surveyor & Leveller
No: F 21/2, Marapana, Kegalle
T.P. No: 0352222379, 0718141955

PLAN NO: 516




Scale 1 :1000

PLAN

of

An allotment of Road called "MAGURUDENIYA OWITAWATTA ROAD"
Being a Survey an allotments as shown as 1 by me
situated in the

Magurudeniya Village at 59D, Makura GN Division in Kegalle Divisional Secretaries Division within Pradesiya Saba Limit of Kegalle

(Mawatha Pallu of Paranakuru Korale)

KEGALLE DISTRICT

SABARAGAMUWA PROVINCE

Containing in extent : 189sq.m, 0.0189Ha, 0A-0R-7.5P

One Hundred and Eighty Nine Square Meters
Zero Decimal Zero One Eight Nine Hectares
No Acres No Roods Seven Decimal Five Perches

NOTE:-
Total Lenth of Road 100m
Width of Road 5ft-7ft

Surveyed on : 10-10-2021
(Boundaries are pointed out by K.S.R.Weerasekara & others)

R. M. I. J. B. Ranatunga (MSI)
Registered Licensed Surveyor
& Leveller
No F 21/2
Marapana, Kegalle
(Reg No 20081756)

(Field Book 16/107)

12-10-2021

06-347

## කෑගල්ල ප්‍රාදේශීය සභාව


1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1989 අංක 12 දරන (ආනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(1) ආ වගන්තිය ප්‍රකාරව 2022.03.11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ ප්‍රකාශයට පත් කරන ලද පහත උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | කහගළකන්දේ හේන මාර්ගය (සමගි මාවත) |
| ග්‍රාම නිලධාරි වසම | : | 52 C පරණගම්පල වසම |
| මාර්ගයේ දිග | : | මීටර් 63.35 (අඩි 207.79) |
| මාර්ගයේ පළල | : | අඩි 08 |

| *මාර්ගයේ වම් පස* | *මාර්ගයේ දකුණු පස* |
|---|---|
| 1. 3329 දරන පිඹුරේ 1 වන බිම් කැබැල්ල | 1. 3329 දරන පිඹුරේ 10 වන බිම් කැබැල්ල |
| 2. 3329 දරන පිඹුරේ 2 වන බිම් කැබැල්ල | 2. 3329 දරන පිඹුරේ 8 වන බිම් කැබැල්ල |
| 3. 3329 දරන පිඹුරේ 3 වන බිම් කැබැල්ල | |
| 4. 3329 දරන පිඹුරේ 6 වන බිම් කැබැල්ල | |


පිඹුරු අංකය : 1062
පරිමාණය 1 : 1000
සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ
පිඹුර
සත්‍ය පිටපතකි
0.0168
0 0 06.64
2016.02.08
2021.12.04

# විවිධ දැන්වීම්

## බණ්ඩාරවෙල මහා නගර සභාව

විවිධ ගාස්තු අය කිරීම - 2022

බණ්ඩාරවෙල මහා නගර සභා බල ප්‍රදේශයේ හඳුනාගත් ස්ථානවලින් 2022.01.01 දින සිට නැවත මේ පිළිබඳව දැන්වීමක් කරනු ලබන තෙක් පහත සඳහන් පරිදි මාසික කසල බද්දක් පනවා අයකිරීම සුදුසු බවට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව 2021 ක් වූ අප්‍රේල් මස 08 වන දින පැවැත්වූ මාසික මහා සභාවේ දී තීරණ අංක 6.1.1 යටතේ සම්මත වී ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජනක නිශාන්ත රත්නායක,
නගරාධිපති.

2022 ක් වූ ජනවාරි මස 01 වැනි දින,
බණ්ඩාරවෙල මහා නගර සභා කාර්යාලයේදී ය.

බණ්ඩාරවෙල මහා නගර සභා බල ප්‍රදේශයට අයත් පහත සඳහන් ස්ථානවලින් මාසිකව කසල බද්දක් අය කිරීම.

| | |
|---|---|
| සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල් සඳහා මාසිකව | රු. 3,000.00 |
| දිවයින පුරා ශාඛා පවතින සුපිරි වෙළඳසැල් සඳහා මාසිකව | රු. 5,000.00 |
| බැංකු හා අනිකුත් මූල්‍ය ආයතන සඳහා මාසිකව | රු. 3,000.00 |
| දිවයින පුරා ශාඛා පවතින වෙළඳ ව්‍යාපාර, සමූහ ව්‍යාපාර, අනුශාඛා සඳහා මාසිකව | රු. 3,000.00 |

## බණ්ඩාරවෙල මහා නගර සභාව

සංශෝධනයයි

**ගලිසකර සේවාවන් ලබාදීමේදී අයකරන ගාස්තු සංශෝධනය කිරීම**

2021.12.10 වැනි දින පළකරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2258 දරන *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ වළ පළකරන ලද බණ්ඩාරවෙල මහා නගර සභාවේ විවිධ ගාස්තු අයකිරීම යටතේ අනු අංක 07 හි ගලිසකර සේවා ලබාදීම සම්බන්ධයෙන් පළකරන ලද ව්‍යාපාර හා ගෘහස්ථ ගාස්තු 2022.02.10 දින සිට නැවත මේ පිළිබඳව දැන්වීමක් කරනු ලබන තෙක් සංශෝධනය කර ඇති බව 2022 ක් වූ පෙබරවාරි මස 10 දින පැවැත්වූ මාසික මහා සභාවේදී තීරණ අංක 5.6 යටතේ තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජනක නිශාන්ත රත්නායක,
නගරාධිපති.

2022 ක් වූ පෙබරවාරි මස 10 වැනි දින,
බණ්ඩාරවෙල මහා නගර සභා කාර්යාලයේදීය.

| අනු අංකය | දැනට අයකරනු ලබන ගාස්තු ප්‍රමාණය (ගලි සේවාව) | සංශෝධනය කරනු ලැබූ මුදල |
|---|---|---|
| 1 | සීමාවෙන් පිටත - 10,000.00 + 1Km 100.00 | සීමාවෙන් පිටත - 15,000.00 + 1Km 150.00 බැගින් යාමට හා ඒමට |
| 2 | ව්‍යාපාරික ස්ථාන (බල ප්‍රදේශය තුළ) රු. 10,000.00 | ව්‍යාපාරික ස්ථාන (බල ප්‍රදේශයෙන් පිටත) රු. 15,000.00 + 1Km 150.00 බැගින් යාමට හා ඒමට |

06-321/1

**බණ්ඩාරවෙල මහා නගර සභාව**

සංශෝධනයයි

**විවිධ ගාස්තු අය කිරීම - 2022**

2021.12.10 දින පළකරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2258 දරන *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළකරන ලද බණ්ඩාරවෙල මහා නගර සභාවේ විවිධ සේවාවන් සඳහා අය කරන ගාස්තු 2022.03.25 දින සිට නැවත මේ පිළිබඳව දැන්වීමක් කරනු ලබන තෙක් සංශෝධනය කර ඇති බව 2022.03.25 දින පැවැත්වූ විශේෂ මාසික මහා සභාවේදී තීරන අංක 3.1 යටතේ තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජනක නිශාන්ත රත්නායක,
නගරාධිපති.

2022 ක් වූ මාර්තු මස 25 වැනි දින,
බණ්ඩාරවෙල මහා නගර සභා කාර්යාලයේදීය.

**01. ජල බවුසරයක් ලබාදීම වෙනුවෙන් ගාස්තු අයකිරීම**

නගර සභා සීමාව තුළ ආගමික ස්ථාන/මළ ගෙවල්/දානමය කටයුත්තකට ජල බවුසරය නොමිලේ සපයනු ලැබේ.

| *ජල බවුසරයේ ප්‍රමාණය* | *පෞද්ගලික/රාජ්‍ය ආයතන දැනට අයකරනු ලබන ගාස්තුව* | *සංශෝධිත ගාස්තුව* |
|---|---|---|
| ලීටර් 6000 | රු. 2,500.00 | රු. 3,500.00 |
| ලීටර් 5000 | රු. 2,000.00 | රු. 3,000.00 |
| ලීටර් 3000 | රු. 1,500.00 | රු. 2,500.00 |

ප්‍රවාහන ගාස්තු කි.මී. 1 කට ට්‍රැක්ටර් බවුසරයක් රු. 100.00, ලොරි බවුසරයක් රු. 220.00 ක් ද වැඩිවන සෑම කි.මී. 1කටම රු. 120.00 ක් බැගින් ගාස්තුවක් ගෙවිය යුතුය.

**02. ජලය රහිත බවුසරය (කි.මී. 1 ක් සඳහා)**

| *ජල බවුසරයේ ප්‍රමාණය* | *දැනට අයකරනු ලබන ගාස්තුව* | *සංශෝධිත ගාස්තුව* |
|---|---|---|
| ලීටර් 6000 | රු. 55.00 | රු. 75.00 |
| ලීටර් 5000 | රු. 50.00 | රු. 70.00 |
| ලීටර් 3000 | රු. 45.00 | රු. 65.00 |

**03. බණ්ඩාරවෙල මහා නගර සභාවේ ආදාහනාගාරයේ ආදාහනයක් සිදුකිරීම සඳහා ගාස්තු අය කිරීම.**

| | *දැනට අයකරන ගාස්තුව* | *සංශෝධිත ගාස්තුව* |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ | රු. 5,000.00 | රු. 6,000.00 |
| සභා බල ප්‍රදේශයෙන් පිටත | රු. 10,00.00 | රු. 12,500.00 |

**04. ගිනි නිවීම වෙනුවෙන් ගාස්තු අය කිරීම**

| | *දැනට අයකරන ගාස්තුව* | *සංශෝධිත ගාස්තුව* |
|---|---|---|
| ගිනි නිවන රථය යෙදවීම (ස්වභාවික ආපදා වලදී, රජයේ ප්‍රභූන් පැමිණීමේදී වෙන්කර තැබීම් හැර වාණිජමය කටයුතු වලදී ගිනි නිවන රථය ලබා ගැනීමට අපේක්ෂා කර වෙන්කර ගැනීමට ඉල්ලීම් කිරීමේදී අයකරන ගාස්තුව) | රු. 15,00.00 | රු. 30,000.00 |
| ගිනි නිවීම පිණිස සපයන ජල බවුසරය සඳහා | රු. 2,000.00 | රු. 3,500.00 |

**05. සභාව සතු විදුලි උත්පාදක යන්ත්‍රය කුළියට දීම**

| | *දැනට අයකරන ගාස්තුව* | *සංශෝධිත ගාස්තුව* |
|---|---|---|
| නගර ශාලාවේ පැවැත්වෙන උත්සව සඳහා වෙන් කරවා දීම පිණිස විදුලි උත්පාදක යන්ත්‍රය වෙනුවෙන් අය කරන ගාස්තුව (ඉන්ධන සපයා දී) | රු. 750.00 | ටිකට් අලෙවි කරමින් (ආදායම් උත්පාදන) කරනු ලබන වැඩසටහන් සඳහා පැයකට රු. 10.00)<br>ආදායම් උපයමින් සිදුකරනු ලබන අධ්‍යාපන සම්මන්ත්‍රණ සහ අනෙකුත් වැඩසටහන් සඳහා පැයකට රු. 5,000.00 |

**06. ක්‍රීඩා පිටි ලබාදීම (ආදායම් උපයමින් සිදුකරනු ලබන සියලුම වැඩසටහන් සඳහා දිනකට)**

| | |
|---|---|
| වැවතැන්න ක්‍රීඩාපිටිය ලබාදීම | දිනකට රු. 5,000.00 |
| උතුරු කැබිල්ලේවෙල ක්‍රීඩාපිටිය ලබාදීම | දිනකට රු. 5,000.00 |
| ඉණිකම්බැද්ද ක්‍රීඩාපිටිය ලබාදීම | දිනකට රු. 5,000.00 |

**07. ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා ගාස්තු අයකිරීම**

| | |
|---|---|
| නගරය අවට සවිකර ඇති ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා ගාස්තුව | දිනකට රු. 3,000.00 |

06-321/2

---

**බණ්ඩාරවෙල මහා නගර සභාව**

සංශෝධනයයි

**විවිධ ගාස්තු අය කිරීම**

2021.12.10 දින පළකරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2258 දරන *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ කරන ලද බණ්ඩාරවෙල මහා නගර සභාවේ මාර්ග උපකරණ කුළියට දීම වෙනුවෙන් අය කරන ගාස්තු 2022.05.19 දින සිට නැවත මේ පිළිබඳව දැන්වීමක් කරනු ලබන තෙක් සංශෝධනය කර ඇති බව 2022.05.19 දින පැවැත්වූ මාසික මහා සභාවේදී තීරණ අංක 6.1.1 යටතේ තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජනක නිශාන්ත රත්නායක,
නගරාධිපති.

2022 මැයි මස 19 වැනි දින,
බණ්ඩාරවෙල මහා නගර සභා කාර්යාලයේ දී ය.

*මාර්ග උපකරණ කුළියට දීම :*

| *කාරණය* | *දැනට අයකරන ගාස්තුව* | *සංශෝධිත ගාස්තුව* |
|---|---|---|
| බැකෝ යන්ත්‍රය (පැයකට රු.) | රු. 2,750.00 ඉන්ධන සහිතව | රු. 2,750.00 ඉන්ධන රහිතව අවම වශයෙන් පැය 03ට වැඩි වැඩි විය යුතුයි. |
| මෝටර් ග්‍රේඩරය ඉන්ධන සහිතව (පැයකට රු.) (අවම වශයෙන් පැය 03 ක් විය යුතුයි | රු. 4,500.00 ඉන්ධන සහිතව | රු. 4,500.00 ඉන්ධන රහිතව අවම වශයෙන් පැය 03ට වැඩි වැඩි විය යුතුයි. |
| ටොන් 8 මාර්ග තලනය (ගල් රෝලය) | රු. 12,000.00 | රු. 2,000.00 (ඉන්ධන රහිතව පැයකට) අවම වශයෙන් පැය 06ට වැඩි වැඩි විය යුතුයි. |

ඉහත මාර්ග උපකරණ කුළියට ලබාගැනීමේදී අවශ්‍ය තෙල් ප්‍රමාණය නගර සභාවෙන් ලබා දෙන්නේ නම්, වෙළඳ පොළේ එදිනට පවත්නා තෙල් මිල සැළකිල්ලට ගෙන භාවිතයට ගනු ලබන තෙල් ප්‍රමාණයට අනුව ගෙවිය යුතු මුදල මහා නගර සභාවට ගෙවීමෙන් අනතුරුව සේවාව ලබාගත හැක.

06-321/3

---

**අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව**

2022 වර්ෂයට සපයනු ලබන සේවාවන් හා දේපළ කුළියට දීම වෙනුවෙන් ගාස්තු අයකිරීම් සංශෝධනය

2021.11.26 දිනැති අංක 2256 වැනි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි IV (ආ) වැනි කොටසෙහි පල කරන ලද 2022 වර්ෂයට සපයනු ලබන සේවාවන් හා දේපළ කුළියට දීම වෙනුවෙන් ගාස්තු අය කිරීම් සංශෝධනය සඳහා අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව විසින් 2022.03.25 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ තීරණ අංක 8:1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගාමිණී වීරබද්ධන,
සභාපති,
අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව.

2022 මාර්තු මස 25 වැනි දින,
අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

2022 වර්ෂයේ මාර්තු මස 25 වැනි දින සිට ආදාහනාගාරය සඳහා ගාස්තු අය කිරීම නැවත සංශෝධනය කළ යුතු බවට අඟුණකොළ පැලැස්ස ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

| *අනු අංකය* | *දේපළ* | *රු. ශත* |
|---|---|---|
| 01 | ආදහනාගාරය සඳහා ගාස්තු අය කිරීම | |
| | * ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ | 15,000.00 |
| | * ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත | 17,000.00 |

06-366

## අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ආදාහනාගාරවල කටයුතු සඳහා ගාස්තු පැනවීම

අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ජූනි මස 16 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 5.5 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. පුෂ්පලාල් කුමාරසිංහ,
සභාපති,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2022 ජූනි මස 16 වැනි දින,
බටපොල,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් මෘත දේහයන් ආදාහන කටයුතු සඳහා 2022 වර්ෂය සඳහා බටපොල/ගෝනපීනුවල ආදාහනාගාරවල ආදාහනාගාර පහසුකම් ලබා දීම සඳහා පහත පරිදි ගාස්තු යෝජනා කරන්නීය.

| | රු. ශත |
|---|---|
| 1. බල ප්‍රදේශය තුළ පදිංචි අයකුගේ මෘත දේහයක් ආදාහනය සඳහා | 7,000 0 |
| 2. බල ප්‍රදේශයෙන් පිට පදිංචි අයකුගේ මෘත දේහයක් ආදාහනය සඳහා | 12,000 0 |

06-367/1

---

## අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා අනතුරුදායක ගස් ඉවත් කිරීමේ ගාස්තු

අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ජූනි මස 16 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 5.8 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. පුෂ්පලාල් කුමාරසිංහ,
සභාපති,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2022 ජූනි මස 16 වැනි දින,
බටපොල,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයට අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා නිකුත් කරන ඉල්ලුම්පත් හා පරීක්ෂණ සඳහා පහත පරිදි ගාස්තු යෝජනා කරන්නීය.

| | | රු. ශත |
|---|---|---|
| 1. | ඉල්ලුම්පත් පරීක්ෂණ ගාස්තුව | 1,000 0 |
| 2. | එක් කොස් ගසක් සඳහා ගාස්තුව | 2,000 0 |
| 3. | එක් දෙල් ගසක් සඳහා ගාස්තුව | 1,500 0 |
| 4. | එක් තල් ගසක් සඳහා ගාස්තුව | 1,000 0 |
| 5. | එක් පොල් ගසක් සඳහා ගාස්තුව | 2,000 0 |
| 6. | අනෙකුත් ඕනෑම ගසක් සඳහා ගාස්තුව | 1,500 0 |

අයදුම්කරු ඉඩම් දෙකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක පිහිටි ගස් සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කරන්නේ නම් වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු බව ගරු සභාවට යෝජනා කරන්නීය.

06-367/2

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**

සංශෝධනයයි

2022 වර්ෂය සඳහා වෙනත් ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන වලට යටත්ව මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂය සඳහා වෙනත් ගාස්තු ප්‍රමාණයක් අය කිරීම යටතේ J.C.B.යන්ත්‍රය කුළියට දීමේ දී පැයක් සඳහා අයකරන ගාස්තුව රු. 2,100.00 බව 2021.10.13 වැනි දින තීරණ අංක 5:6 යටතේ මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

එම ගාස්තු සංශෝධනය කර J.C.B.යන්ත්‍රය කුළියට දීමේ දී පැයක් සඳහා අය කරන ගාස්තු රු. 5,200.00 ලෙස 2022.05.17 දිනැති තීරණ අංක 6:8 යටතේ මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

සෝමසිරි වීරමන්,
සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

2022 මැයි මස 17 වැනි දින,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

06-349

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.